# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1988 අංක 65 දරන අපගමන බදු (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 65 දරන අපගමන බදු (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 34/88

**ගුවන් සංතරණ පනත සංශෝධනය කිරීම සඳහා ද; ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය සහ ගුවන් සංතරණ පනත යටතේ පත් කරන ලද අනුයෝජිතයා විසින් අපගමන බදු එකතු කිරීම වලංගු කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 65 දරන අපගමන බදු (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. ගුවන් සංතරණ පනතේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **365 වන අධිකාරියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) මේ වගන්තිය බලාත්මක වූ දින සිට හා ඉන් පසුව, සහ 1961 අංක 19 දරන අපගමන බදු පනතේ කුමක් සඳහන්ව ඇත ද ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් බැහැරව යන යම් තැනැත්තකුගෙන් ඒ පනත යටතේ අය කරනු ලබන අපගමන බද්ද, 1961 අංක 19 දරන අපගමන බදු පනතේ 4 වන වගන්තියෙන් නියමිත පරිදි ඒ ගුවන් යානය මෙහෙයවන්නා විසින් නොව, අනුයෝජිතයා විසින් එකතු කරනු ලැබිය යුතු ය. මේ උප වගන්තිය යටතේ අනුයෝජිතයා විසින් එකතු කරන ලද සියලු බදු ආණ්ඩුව සඳහා සහ ඒ වෙනුවෙන් ඔහු විසින් දරනු ලැබිය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "ආණ්ඩුව වෙනුවෙන් එකතුකර ගන්නා ලද හෝ අයකර ගන්නා ලද" යන වචන වෙනුවට, "ආණ්ඩුව වෙනුවෙන් එකතු කර ගන්නා ලද හෝ අය කර ගන්නා ලද ((2අ) උපවගන්තිය යටතේ ඔහු විසින් එකතු කර ගන්නා ලද අපගමන බදු ඇතුළුව)" යන වචන ආදේශ කිරීමෙන්.

3. මේ පනත ආරම්භ වන දිනට ඉහතින් ම වූ දිනයේ දී, 1961 අංක 19 දරන අපගමන බදු පනතේ 6 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ගුවන් තොටුපළ අරමුදලේ බැරට ඇති සියලු මුදල්, මේ පනත ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබ තිබිය යුතු ය. **ගුවන් තොටුපළ අරමුදලේ බැරට ඇති මුදල්, ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබ තිබිය යුතු බව.**

වලංගු කිරීම.

4. (1) 1979 අගෝස්තු මස 1 වන දිනයෙන් ආරම්භව, 1983 මාර්තු මස 24 වන දිනයෙන් අවසන් වන කාලය තුළ ගුවන් යානා මගින් ශ්‍රී ලංකාවෙන් බැහැරව ගිය තැනැත්තන්ගෙන්, ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය විසින් අපගමන බදු එකතු කරනු ලැබීම, ඒ බදු එකතු කිරීම සඳහා ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරියට බලය පවරා නොතිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල වූ ලෙස හෝ නිර්බල වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) ගුවන් සංතරණ පනතේ 21අ වගන්තිය යටතේ කරන ලද ආඥාවේ දිනයෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය තුළ අනුයෝජිතයා විසින්, ගුවන් යානා මගින් ශ්‍රී ලංකාවෙන් බැහැරව යන තැනැත්තන්ගෙන් අපගමන බදු එකතු කිරීම් කරනු ලැබීම, ඒ කාලය තුළ ඒ බදු එකතු කිරීම් සඳහා ඒ අනුයෝජිතයාට බලය පවරා නොතිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල වූ ලෙස හෝ නිර්බල වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) යම් ගුවන් යානයක් මගින් ශ්‍රී ලංකාවෙන් බැහැරව යන යම් තැනැත්තකුගෙන් 1979 අගෝස්තු මස 1 වන දිනයෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය තුළ අපගමන බද්ද එකතු කිරීම පැහැර හැර ඇති ඒ ගුවන් යානයේ සෑම මෙහෙයවන්නකු ම, 1961 අංක 19 දරන අපගමන බදු පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ ඔහුට එරෙහිව පැහැර හැරීම නිසා පැන නගින සියලුම නීති කෘත්‍යවලින් මෙයින් නිදහස් කරනු ලැබේ.

(4) මේ පනත ආරම්භවීමේ දිනයට පෙරාතුව, ගුවන් සංතරණ පනතේ 23 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, ඒ නියමය කරන ලද්දේ ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් අනුයෝජිතයා විසින් එකතු කරන ලද අපගමන බදු ද ඇතුළුව අනුයෝජිතයා විසින් එකතු කරන ලද ගාස්තු, බදු සහ අයකිරීම් සම්බන්ධයෙන් වීමේ හේතුව මත පමණක් නිර්බල වූ ලෙස හෝ නිර්බල වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි—

" ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය " යන්නෙන්, 1979 අංක 46 දරන ගුවන් තොටුපොළවල් පිළිබඳ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය අදහස් වේ ;

"අනුයෝජිතයා" යන්නෙන්, ගුවන් සංතරණ පනතේ 21 වන වගන්තිය යටතේ පත් කරන ලද අනුයෝජිතයා අදහස් වේ;

"අපනයන බද්ද" යන්නෙන්, 1961 අංක 19 දරන අපගමන බදු පනතේ 4 වන වගන්තිය යටතේ අය කරනු ලබන අපගමන බද්ද අදහස් වේ; සහ

"මෙහෙයවන්නා" යන්න, ගුවන් යානයක් සම්බන්ධයෙන් යෙදෙන විට, 1961 අංක 19 දරන අපගමන බදු පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.